දේවි බාලිකා විද්‍යාලය - කොළඹ

**Devi Balika Vidyalaya - Colombo**

පළමු වාර පරීක්ෂණය - 2012

**First Term Test - 2012**

බුද්ධ ධර්මය

8 ශ්‍රේණිය

පැය එකයි

නම : .................................................. විභාග අංකය : ......................

* පහත දැක්වෙන ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01) කර්මය ලෙස හැඳින්වෙන්නේ,

1. හිතාමතා සිදු නොකරන ක්‍රියාවන්ය
2. තිදොරින් සිදුනොකරන ක්‍රියාවන්ය
3. හිතාමතා සිදුකරන ක්‍රියාවන්ය
4. අහඹු ලෙස සිදුකරන ක්‍රියාවන්ය

02) හිතාමතා සිදුකරන ක්‍රියා බුදු දහමට අනුව කොටස් කීයකට බෙදේද ?

1. 4 ට
2. 3 ට
3. 2 ට
4. නොබෙදේ

03) චතුරාර්ය සත්‍යය පිළිබඳව ඇතුලත් වන්නේ,

1. සේලා සූත්‍රයෙහිය
2. ධම්මචක්කප්පවත්තන සූත්‍රයෙහිය
3. සඳකිඳුරු ජාතකයෙහිය
4. වෙස්සන්තර ජාතකයෙහිය

04) තෘෂ්ණාවේ ප්‍රධාන ප්‍රභේද වලට අයත් නොවන්නේ,

1. භව තණ්හා
2. විභව තණ්හා
3. කාම තණ්හා
4. ගන්ධ තණ්හා

05) කයට සුව පහසු ස්පර්ශය ලැබෙන විට දැනෙන ආස්වාදය නිසා යළි යළිත් ඒවා ලබාගැනීමට ඇතිවන ආශාව

1. පොට්ඨබ්බ තණ්හාව
2. රස තණ්හාව
3. ගන්ධ තණ්හාව
4. රූප තණ්හාව

06) නැවත ඉපදීම ගැන හෝ නොඉපදීම ගැන හෝ විශේෂයෙන් නොසිතා රූප ඇසුරෙන් ලැබෙන ආස්වාදයට ආශා කිරීම මෙනමින් හැඳින්වේ,

1. රූපය පිළිබඳ භව තණ්හාව
2. රූපය පිළිබඳ කාම තණ්හාව
3. රූපය පිළිබඳ විභව තණ්හාව
4. ඉහත කිසිවක් නොවේ

07) රූප , වේදනා , සඤ්ඤා , සංඛාර , විඤ්ඤාණ යනු

1. පංච උපාදානස්කන්ධය වේ.
2. සංඥාස්කන්ධය වේ.
3. පඤ්චස්කන්ධය වේ.
4. සංස්කාරස්කන්ධය වේ

08) 'අප්‍රිය සම්ප්‍රයෝග දුක්ඛය' යනු,
1. ප්‍රිය පුද්ගලයන් සමග එකතු වීමයි
2. අකමැති පුද්ගලයන් සහ අකමැති දේවල් සමග එකතුවීමයි
3. අප්‍රිය සම්ප්‍රප්පලාප කියවීමය
4. මේ කිසිවක් නොවේ

09) චෛතසික දුක් හෙවත් මානසික පීඩා හැඳින්වෙන්නේ,
1. දෝමනස්ස 2. උපායාස 3. පරිදේව 4. ශෝකය

10) 'ව්‍යාධි' නම්
1. දිරායාමයි 2. ඉපදීමයි 4. මරණයයි 4. ලෙඩ වීමයි

* පහත දැක්වෙන ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තිත් ඉර මත ලියන්න.

11) බුදු දහමට අනුව ධම්ම චරියා, සම චරියා වශයෙන් හඳුන්වන්නේ ............................................ වන අතර අධම්ම චරියා, විශම චරියා වශයෙන් හඳුන්වන්නේ ......................................... වේ.

12) ........................................ නම් පව් කිරීමට ඇති ලැජ්ජාව වන අතර ...................................... නම් පව් කිරීමට ඇති බියයි.

13) සැමට පොදු වූ දුක් සමූහයක් ...................................... සූත්‍රයෙහි සහ ...................................... සූත්‍රයෙහි සඳහන් වේ.

14) මරණයෙන් මතු යළි භවයක් පිළිබඳව බලාපොරොත්තු නොවී මේ ජීවිත කාලය තුළ වඩ වඩාත් ඉඳුරන් පිනවීමට ඇති ආශාව ........................................ නමින් හැඳින්වේ.

15) යළි ඉපදීමක් නැත, එබැවින් මැරෙන තෙක් සුන්දර රූප බලමින් ඇස පිනවිය යුතුයැයි ඇති කරගන්නා ආශාව ...................................... පිළිබඳ ...................................... යි.

* පහත දැක්වෙන 'අ' හා 'ආ' කොටස් ගැලපෙන පරිදි යා කරන්න.

| | (අ) | (ආ) |
|---|---|---|
| 16) | මහා භූත රූප | ඉච්ඡිත අලාභ වේ |
| 17) | ශාස්වත දෘෂ්ටියෙන් යුක්ත වූ තණ්හාව | රූප , සංඛාර , විඤ්ඤාණ වේ. |
| 18) | උච්ඡේද දෘෂ්ටියෙන් යුක්ත වූ තණ්හාව | පඨවි , ආපෝ , තේජෝ, වායෝ වේ. |
| 19) | ඉච්ඡා විඝාතය | විභව තණ්හාව වේ. |
| 20) | සංස්කාරස්කන්ධය | භව තණ්හාව වේ. |

(ලකුණු 40)

## 2 - කොටස

* පහත දැක්වෙන ප්‍රශ්න වලින් තෝරාගත් ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

01) දුක්ඛාර්ය සත්‍යය යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වා ඒවායේ මුල් තුල පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

02) දුක්ඛ සමුදයාර්ය සත්‍යයෙහි දැක්වෙන දුකට හේතුව කුමක්දැයි ලියා එය තෙවැදෑරුම් වන ආකාරය පෙන්වා ඒවා වෙන වෙනම කෙටියෙන් විස්තර කරන්න.

03) දස අකුසල් හා දස කුසල් වෙන වෙනම ලියා දක්වන්න.

04) 'ඉච්ඡිත අලාභ දුක්ඛය' ඔබේ වචනයෙන් පැහැදිලි කරන්න.

05) අධම්ම චරියාවෙන් වැලකී ධම්ම චරියාවේ යෙදීමෙන් සමාජයට සිදුවන යහපත පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

06) යොවුන් වියේදී ආශාව පාලනය කිරීමෙන් සැලසෙන සෙත පිළිබඳව කෙටි සටහනක් ලියන්න.

(ලකුණු 12 x 5 = 60)